කොළඹ මහා නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 වියාචනය කළ මතය

කොළඹ මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොළඹ මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, වියාචනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.6 ඡේදයේ 1.6.2 (ආ), (ඇ) හා 1.6.4 (ආ), නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 පරිච්ඡේදයේ 3.29 ඡේදය අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීම් යටතේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් හෝ ඉදිකිරීම් ලෙස රු. 2,727,756,460 ක මුදල් ගලා යාමක් සටහන් කර තිබුණු නමුත් ගිණුම්කරණ පද්ධතියේ තොරතුරු අනුව ස්ථාවර වත්කම් අත්කර ගැනීම් වෙනුවෙන් දරන ලද වියදම රු. 1,342,268,824 ක් විය.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නිවැරදිව ගණනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද බව.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 පරිච්ඡේදයේ 3.30 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී පහත දෝෂ පැවතුණි.		
i	ගිණුම්කරණ පද්ධතියේ ලෙජර් ගිණුම් අනුව වර්ෂයේ ප්‍රාග්ධන මූල්‍ය පිරිවැය රු. 202,874,003 ක් දැක්විය යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 200,017,180 ක් ලෙස රු. 2,856,823 ක් අඩුවෙන් පෙන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන යලි ඉදිරිපත් කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද බව.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
ii	මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ ආසියානු සංවර්ධන බැංකු ණය වාරික ගෙවීම් ලෙස රු. 201,632,574 ක මුදල් ගලා යාමක් ලෙස සටහන් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී	ඉදිරියේ දී නිවැරදි තොරතුරු පවත්වා ගනිමින් මූල්‍ය ප්‍රවාහයන්ට ඇති කරන බලපෑම නිවැරදිව හඳුනාගෙනම මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් තුළින් හඳුනා	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

	ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදල් පියවීම සඳහා ගෙවන ලද මුදල රු. 100,816,287 ක් විය.	ගැනීමට කටයුතු කරන බව.	
(ඇ)	ප්‍රමිතියේ 3 පරිච්ඡේදයේ 3.32 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී පහත දෝෂ පැවතුණි.		
i	ගෙවිය යුතු දෑ ලෙස රු. 392,519,862 ක් අඩුකර දක්වා තිබූ නමුත් එම වටිනාකම තුළ ස්ථාවර වත්කම් ණයට ගැනීම් හා ගෙවිය යුතු ආසියානු සංවර්ධන බැංකු ණය වාරික හා ණය පොලී ඇතුළත්ව තිබූ බැවින් එම රු. 392,519,862 ක මුදල අඩුකර දැක්වීම නිවැරදි නොවීය.	නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද බව.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
ii	සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය රු. 184,146,950 ක් ලෙස දක්වා තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අතිරික්තයට සිදුකරන ලද ගැලපීම් යටතේ රු. 19,272,887 ක දක්වා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ගලායාමක් ලෙස රු. 184,165,950 ක් දක්වා තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
iii	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තයට සිදුකරන ලද ගැලපීම් යටතේ ප්‍රාග්ධන මූල්‍ය පිරිවැය ලෙස රු. 201,632,374 ක් දක්වා තිබුණු නමුත් ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදලේ පොළිය පියවීම සඳහා මහා භාණ්ඩාගාරයට ගෙවන ලද මුදල රු. 93,511,307 ක් විය.	පොලී වටිනාකම් නිවැරදිව හඳුනා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
iv	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තයට සිදුකරන ලද ගැලපීම් යටතේ අතිරික්තතා ඌනතා ගිණුමට සිදුකරන ලද ගැලපීම් ලෙස රු. 2,834,619 ක් අඩුකර දක්වා තිබුණද අතර අතිරික්තතා ඌනතා ගිණුම ලැබීම් ගෙවීම් වාර්තා කරන	පිළිතුරු ලබා දී නොමැත.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

	ගිණුමක් නොවන බැවින් එකී දැක්වීම නිවැරදි නොවීය.		
v	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ සංචලන යටතේ ගෙවිය යුතු දෑ අඩුවීම් රු. 859,783,815 ක් දක්වා තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් වගකීම් ප්‍රකාශය අනුව ගෙවිය යුතු දෑ අඩුවීම රු. 381,765,655 ක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 4 වන පරිච්ඡේදයේ 4.14 ඡේදය ප්‍රකාරව පූර්ව කාල පරිච්ඡේද වරදෙහි ස්වභාවය අස්ථිත්ත්වයක් විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් පූර්ව කාල පරිච්ඡේදයට සම්බන්ධ වැරදි සඳහා ගැලපීම් රු. 21,160,932 ක් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ ගලපා තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.	හෙළිදරව් කිරීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු උපලේඛන අනුව විගණනයට ඉදිරිපත් කිරීමට වගබලා ගන්නා බව	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණන විමසුම් හා විගණන වාර්තා මඟින් කොළඹ මහා නගර සභාව සතුව ඉඩම් 168 ක් පවතින බවට කරුණු වාර්තා කළද මහා නගර සභාවේ ඉඩම් අංශය විසින් සත්‍ය වශයෙන්ම ඉඩම් 132 ක් මහා නගර සභාව සතු බවට හඳුනාගෙන වාර්තා කර තිබුණි. එසේම එම ඉඩම් 132 අතරින් ඉඩම් 27 ක් තක්සේරු කර රු. 20,951,855,000 ක වටිනාකමක් පොත්වලට ගෙන ඉඩම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ඉඩම් 105 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණු හෙයින් කොළඹ මහා නගර සභාව සතු ඉඩම්වල සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල පිළිඹිබු නොවීය .	තක්සේරු කරන ලද ඉඩම් 27 ක් හා ඒවායේ පිහිටි ඉඩම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ඉඩම් මැනුම් කර නව පිඹුරුපත් ලැබෙන අනුපිළිවෙළ අනුව තක්සේරු වටිනාකම ඉඩම් ලේඛණයට ඇතුළත් කිරීමට පියවර ගන්නා බව.	සියලු ඉඩම් අයිතිය තහවුරු කර ගැනීමෙන් අනතුරුව තක්සේරු කිරීම හා ඉඩම් ලේඛනය නඩත්තු කිරීම කළ යුතුය.

(ආ)	2023 දෙසැම්බර් 31 දින වන විට ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක වූ අපජල කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 03 හි ඉදිකිරීම් අවසන්ව නොතිබියදී ව්‍යාපෘතිය වසා දමා තිබුණු අතර, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ව්‍යාපෘතියේ පිරිවැය රු. 24,634,150,460 ක් විය. මෙම ව්‍යාපෘතිය යටතේ මිලදීගෙන තිබුණු වත්කම් මහා නගර සභාව විසින් පරිහරණය කරන අතර පොම්පාගාර 04 ක් ඇතුළු මලනාලිකා භාවිතා කරමින් පැවතියත් එකී වත්කම් නගර සභාවට භාරගෙන වත්කම් ලේඛන යාවත්කාලීන කිරීම හා පිරිවැය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ මුළු ආයෝජනය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් ද සිදුකර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේ දී යලි ගිණුම් නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව .	විදේශ ණය ව්‍යාපෘතිය අවසන් කිරීමේ ගිණුම සකස් කිරීම, වත්කම් නිවැරදිව භාර ගැනීම හා වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2022 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් කොළඹ මහා නගර සභාවට ප්‍රදානය කරන ලද රු. 2,355,300,000 ක් වූ ගිනි නිවීමේ රථ 13 ක් හා පෙර වර්ෂවල ප්‍රදානය කරන ලද මෝටර් වාහන මෙන්ම 2023 වර්ෂයේ ලද රු. 4,500,000 වූ මෝටර් වාහනයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වියදම් ලෙස හඳුනාගත යුතු රු. 94,734,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට නිවැරදි කර ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවද, සමාලෝචිත වර්ෂයේදී ක්ෂය කිරීම් නොකරන බැවින් ක්‍රම ක්ෂය කිරීම් ද නොකරන ලද බවත්, ඒ සම්බන්ධ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශන තුළින් සිදුකර ඇති බව.	ගිණුම් ප්‍රතිපත්ති යටතේ පිළිගෙන ඇති අනුපාත අනුව අදාළ ක්ෂය වෙන් කිරීම් ගිණුම්ගත කළ යුතුයි.

1.6.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කෙටුම්පත් සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීමෙන් අනතුරුව ජ'නල් 12 ක් මඟින් ගිණුම් 07 කට රු. 13,442,951,253 ක් හර කිරීමත්, ගිණුම් 10 කට බැර කිරීමත් සිදු කළ බව විගණනයට දන්වා තිබුණු නමුත් පරිගණක ගිණුම්කරණ පද්ධතිය තුළ වූ ලෙජර් ගිණුම් එපරිදි යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගිණුම්කරණ පද්ධතිය හා මූල්‍ය ප්‍රකාශන අතර එම වටිනාකමින් නොසැසඳුණු ශේෂයක් පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සියළු ගැලපීම් පරිගණක ගිණුම්කරණ පද්ධතිය තුළ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ආ)	ස්ථාවර වත්කම් මොඩියුලයේ පවතින ශේෂ වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ශේෂ වටිනාකම් අතර රු. 64,531,258,430 ක වෙනසක් පැවතුණි.	පද්ධතිය යවත්කාලීන කිරීමට වහා කටයුතු කරන බව.	දෝෂ හඳුනාගෙන නිවැරදි කළ යුතුය.
(ඇ)	නාගරික රසායනාගාරය සහ නාගරික රස පරීක්ෂණාගාරයට අයත් ගබඩා දෙකෙහි පරිගණක පද්ධතිය අනුව ශේෂය රු. 132,144 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශය අනුව ශේෂය රු. 10,243,122 ක් වූයෙන් රු. 7,110,978 ක වෙනසක් පැවතුණි.	නාගරික ගබඩා අංශයේ කේවල ශේෂ හා මූල්‍ය ප්‍රකාශන අනුව ගබඩා ශේෂ ඉදිරියේදී නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා කටයුතු කරන බව.	නොසැසඳුනු පාලන ගිණුම් නිවැරදි කළ යුතුය.
(ඈ)	මූල්‍ය ප්‍රකාශනය අනුව මුළු ආදායම රු. 15,538,428,829 ක් වුවත්, ගිණුම්කරණ පද්ධතිය අනුව මුළු ආදායම රු. 44,291,547,271 ක් වූයෙන් රු. 28,753,118,442 ක වෙනසක් නිරීක්ෂණය විය.	ඉදිරි වර්ෂයේ දී සංශෝධනය කිරීමට කටයුතු කරන බව.	නොසැසඳුනු පාලන ගිණුම් නිවැරදි කළ යුතුය.

1.6.4. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට වත්කම් වගකීම් ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු රු. 558,212,710 ක් වූ ගබඩා, කාර්යාල, පරීක්ෂණාගාර හා පිරවුම්හල්වල පවතින තොග සම්බන්ධව සමීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් වුවද, තොග වටිනාකම් ඇතුළත් නොවීමෙන් තොග වටිනාකම විගණනයේදී තහවුරු කළ නොහැකි විය. සමීක්ෂණ වාර්තා අනුව 2018, 2019 වර්ෂවල සිට පැවත එන අපහරණය කිරීමට යෝජනා කර තිබුණු යල්පැන ගිය හා විනාශ වූ තොගයක් ද ඇතුළත්ව පවතින බැවින් තොග වටිනාකම නිවැරදි නොවන බව විගණනයේදී තහවුරු විය.	ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	තොග වටිනාකම් ඇතුළත් සමීක්ෂණ වාර්තා පිළියෙළ කළ යුතු අතර 2018 හා 2019 වර්ෂ වල සිට පැවතෙන අපහරණයට යෝජිත යල්පැන ගිය හා විනාශ වූ තොග අපහරණය කර තොග වටිනාකම තහවුරු කර ගැනීම කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ සඳහන් එකතු වටිනාකම රු. 24,112,940,597 ක් වූ වත්කම් කාණ්ඩ 07 ක් යටතේ වාර්තා කර ඇති වත්කම් සම්බන්ධව වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා විස්තරාත්මක උපලේඛන වැනි සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.	විගණන පෙන්වා දීම් හා කේවල ශේෂවල ඇති දෝෂ නිවැරදි කිරීම සඳහා 2025 වර්ෂයේදී කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන අතර, ඒ අනුව ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම් ලේඛන හා උප ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් එකතුව රු. 215,220,335 ක් ගෙවීම් කර තිබුණු නමුත් අත්පත් කරගත් ඉඩම් ප්‍රමාණයන් හා වටිනාකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් නොවීය. තවද මෙම ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීම ද සිදුකර නොතිබුණි.	ඉඩම් ලේඛනයේ මෙතෙක් තොරතුරු ඇතුළත් කර නොමැති බව.	මිලදී ගනු ලබන සියලු ඉඩම්වලට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු අතර ඉඩම් ලේඛනය යාවත්කාලීන කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණු එකතුව රු. 81,514,303 ක් වූ යන්ත්‍ර උපකරණ සහ වෙනත් වත්කම් අයිතම පිළිබඳ උපලේඛනයක් පිළියෙළ කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට අපොහොසත් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මිලදීගත් යන්ත්‍ර උපකරණ හා වෙනත් වත්කම් වටිනාකමෙහි නිරවද්‍යතාවය පරීක්ෂා කර තහවුරු කර ගැනීමට නොහැකි විය.	පෙන්වා ඇති රු. 81,514,303 කට අදාළ ශේෂ ඉදිරි වර්ෂයේදී සංශෝධනය කරන බව.	සියලුම මිලදී ගත් වත්කම් සම්බන්ධයෙන් උපලේඛන ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**252** වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනත 188(ඉ) වගන්තිය	සභාවේ යම් රැස්වීමකට කමිටුවකට සහභාගී වන්නා වූ සභාවේ සභිකයින්ට, නිළධාරීන්ට හා සේවකයන්ට සංග්‍රහ කිරීම සඳහා වියදම් දැරීමට ලැබී ඇති බලය අවභාවිතා කරමින් සාවද්‍ය බිල්පත්‍ර ඉදිරිපත් කර රු. 8,443,215 ක වියදමක් දරා තිබුණි.	නගරාධිපතිතුමියගේ උපදෙස් පරිදි සංග්‍රහ වියදම දරා ඇති බව.	නීතියට පටහැනි වියදම් වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගත යුතුය.

(ආ) මහා නගර සහා මූලාය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග සඳහා වූ 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය 62 වන නියෝගය	මහා නගර සහා අරමුදලට ප්‍රවර්තන වර්ෂයට ආදායම් මූලාශ්‍ර වන දේපළ හඳුනා ගැනීම සඳහා වූ සමීක්ෂණයක් සිදුකොට ඊට අදාළ වාර්තා සෑම වර්ෂයකම මාර්තු 31 වන දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පසුවිපරම් කරන බව.	නියෝගය අනුව ආදායම් මූලාශ්‍ර වන දේපළ හඳුනාගත යුතුය.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
i. මු.රෙ 135	ගණන් දීමේ නිලධාරියෙකු එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම ආදී කාර්යයන් තමාගේ යටතේ නිලධාරීන් වෙත පවරා දිය යුතු වුවත්, නාගරික කොමසාරිස් විසින් එලෙස විධිමත් ලෙස කාර්යයන් පවරා නොතිබුණි.	2025 ජනවාරි 15 දින අංක 1090 දරන තීරණය අනුව බලය පැවරීම අනුමත කර ඇති බව.	මුදල් රෙගුලාසිය අනුව කාර්යයන් පවරා දී විධිමත් කළ යුතුය.
ii. මු257 රෙ.	ගෙවීම සඳහා ගෙවන නිළධාරියකු වෙත ඉදිරිපත් කිරීමට පෙර සියලුම වවුචර් සහතික කොට තිබිය යුතු වුවත්, රු. 89,554,448 ක ගෙවීම් වවුචර් 14 ක් සහතික කොට නොතිබුණි.	ප්‍රමාද දෝෂයකින් සහතික කිරීම සිදුව නොමැති බව.	සියලු ගෙවීම් වවුචර් සහතික කරන බව තහවුරු වන පරිදි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
i. 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛය	නිල වාහන සඳහා හිමිකමක් නොමැති තනතුරක් වූ ප්‍රධාන වෛද්‍ය නිළධාරී වෙත නිල වාහනයක් අනුයුක්ත කර මාසිකව ඉන්ධන ලීටර් 210 ක් වෙන්කර තිබුණි.	ඉදිරියේදී සංචිත වාහනයක් ලෙස සලකා කටයුතු කරන බව.	චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය.

ii.	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ IV වගන්තිය	අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කරගත යුතු වුවත් එකී උපදෙස්වලට පටහැනිව ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරින් තිදෙනෙකු වෙත රු. 123,754 ක අතිකාල ගෙවා තිබුණි.	ඉදිරියට නියමිත පටිපාටියෙන් බැහැර නොවීමට උපදෙස් ලබා දී ඇති බව.	නීතියට පටහැනිව සිදුකරන ලද ගෙවීම් ආපසු අයකර ගත යුතුය.
(ඉ)	**භාණ්ඩාගාර චක්‍රලේඛ**			
i.	2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 ඡේදය	සියලුම ආකාරයේ උත්සව පැවැත්වීම වෙනුවෙන් රජයේ හෝ රාජ්‍ය ආයතනවල ඉපයීම් භාවිතා කරමින් සිදුකරන සංග්‍රහ වියදම් නැවැත්විය යුතු වුවත් එකී උපදෙස් නොසලකා උත්සව පැවැත්වීම සඳහා සභා අරමුදල් රු. 2,191,375 ක් භාවිතා කර තිබුණි.	මහා නගර සභා ආඥා පනතේ 188 (1) (ත) හි විධිවිධාන අනුව වියදම් දරා ඇති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
ii.	කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2022 සැප්තැම්බර් 16 දිනැති අංක 11/2022 දරන චක්‍රලේඛය හා 2015 අගෝස්තු 24 දිනැති අංක 9/2015 (10(ඇ) දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛය	සුන්බුන් ලෙස අපහරණය කිරීම සඳහා හඳුනා ගනු ලබන වාහන අපහරණය කිරීමට මත්තෙන් එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් මඟින් කටයුතු කළ යුතු වුවත් වාහන 105 කට අදාළව වෙන්දේසියෙන් පසුව මේ දක්වාම ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	**වෙනත් චක්‍රලේඛ**			
i.	2012 ජුලි 11 දිනැති අංක W/LPD/01/ දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය	රාජකාරී වේලාවෙන් බැහැරව පැවැත්විය යුතු රැස්වීම් රාජකාරී වේලාව තුළ පවත්වා රු. 1,797,000 ක කමිටු දීමනා ගෙවා තිබුණි.	ඉදිරියේදී කාර්යාල වේලාවෙන් පසුව කමිටු පැවැත්වීමට කටයුතු කරන බව.	නීතියට පටහැනි ගෙවීම් ආපසු අයකර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.2,996,743,075 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.2,940,432,774 ක් විය.

2.2 මූල්‍ය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම් 03 කට අදාළව රු.9,402,935 ක් වූ සෘජු හෝ සාවද්‍ය බැරකිරීම් ද ජංගම ගිණුම් 02 කට අදාළ රු.4,826,010 ක් වූ සෘජු හෝ සාවද්‍ය හර කිරීම් ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි බැංකු සැසඳුම් මඟින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව.	සෘජු හෝ සාවද්‍ය හර කිරීම් සහ බැරකිරීම් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 03 ක මුදල් පොත් අනුව 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය හා වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව මුදල් ශේෂය අතර රු. 20,729,138 ක වෙනසක් විය.	වෙනසට හේතු අනාවරණය කරගෙන ඇති බැවින් 2025 වසරේදී නිවැරදි කරන බව.	වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි තොරතුරු පදනම් කරගත යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
i.	වරිපනම් හා බදු	8,530.7	5,875.3	5,363.7	4,429.5	7,366.5	5,430.3	5,565.7	4,492.1
ii.	කුලී	330.5	240.0	269.7	300.8	319.8	309.2	226.6	1,235.1
iii.	බලපත්‍ර ගාස්තු	5,541.7	23.6	4,891.7	2,701.4	126.3	162.2	98.6	4.5
iv.	වෙනත් ආදායම්	713.0	57.3	214.6	10,237.3	2,714.6	2,093.8	1,841.3	4,438.1
	එකතුව	15,115.9	6,196.2	10,739.7	17,669.0	10,527.2	7,995.5	7,732.2	10,179.8

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

		විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	i	2024 ජනවාරි 01 දිනට පැවති රු. 4,414,636,366 ක් වූ වරිපනම් හිඟ මුදලින් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,134,906,711 ක් පමණක් අයකර ගෙන තිබුණෙන් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 26 ක් පමණක් විය. ඒ අනුව වරිපනම් හිඟ මුදල් අයකර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළ වරිපනම් හිඟ මුදල රු. 905,831,275 ක් වීමෙන් වරිපනම් හිඟ මුදල වර්ධනය වෙමින් පැවතුණි. පෙර වර්ෂවල හිඟ පැවතියදී සමාලෝචිත වර්ෂයේ වරිපනම් මුදල ගෙවීමට අවසර ලබාදීම ද හිඟ මුදල් වර්ධනය වීමට හේතු වී තිබුණි.	පොදුවේ ගත් කළ පෙර වර්ෂයට වඩා අයකර ගැනීමේ 0.3 % ක පමණ සුළු වර්ධනයක් ඇති බව.	මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
	ii	ඉදිරිපත් වූ තොරතුරු අනුව රජයේ දේපළ 5945 ක් වූ අතර ඊට අදාළ හිඟ වරිපනම් මුදල රු.714,735,781 ක් විය. එකී හිඟ මුදල ගෙවිය යුතු රජයේ ආයතන කවරේද යන්න පිළිබඳ තොරතුරු පරිගණක පද්ධතියේ නොවූ අතර වරිපනම් නිවේදන කා වෙත භාර දුන්නේද යන්න ගැටළු සහගත විය. පරිගණක පද්ධතියේ ගෙවූ මුදල යාවත්කාලීන කර හිඟ මුදල් ගෙවීම් ගිණුම්ගත කර තිබුණු නමුත් ගෙවීම් කළ ආයතනය කුමක් ද යන්න පද්ධතිය තුලින් අනාවරණය නොවීය.	රජයේ දේපළ පිළිබඳ තොරතුරු පරිගණක පද්ධතිය මඟින් ලබාගත හැකි බව.	නිවැරදි තොරතුරු මත පමණක් වරිපනම් මුදල් භාර ගැනීම සම්බන්ධව බැංකු සමඟ ගිවිසුම්ගත එකඟතාවයකට පැමිණිය යුතුය.
	iii	දේපළ හිමිකරුවන් විසින් අදාළ බැංකු මගින් වරිපනම් ගෙවා තිබුණද, ඒවා නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොවීම හේතුවෙන් තවදුරටත් හිඟ ශේෂයන් පෙන්නුම් කරමින් පවතින බැවින් නාගරික භාණ්ඩාගාරික විසින් වරිපනම් පැහැර හැරීමට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග වලට වරිපනම් ගෙවූ පුද්ගලයින් ලක් වීමට ඉඩකඩක් පැවැතුණි.	වාර්ෂිකව අවිනිශ්චිත ගිණුමේ ශේෂය අඩුවෙමින් පවතී.	බැංකු මඟින් වරිපනම් ගෙවීම් විස්තර අනුව මහා නගර සභාවේ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	කුලී ආදායමට ඇතුළත් ප්‍රධානම සංරචකයක් වූ පදික වෙළඳසැල් සඳහා ගිණුම්ගත කළ යුතු ආදායම රු. 142,619,981 ක් වීමෙන් ඇස්තමේන්තුගත පදික වෙළඳසැල් ආදායම වූ රු. 104,000,000 කට වඩා එය සියයට 37.13 ක් වැඩි වීමක් විය. තවද, වර්ෂය තුළ රැස්කළ ආදායම රු. 77,722,430 ක් වී තිබුණි. වර්ෂය ආරම්භයේ රු. 665,040,434 ක් වූ පදික වෙළඳසැල් හිඟ මුදල 2024 දෙසැම්බර් 31 දින වන විට රු. 729,980,358 ක් දක්වා වැඩි වී තිබුණි.	පදික කඩ වෙත ගොස් කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් ආදායම් නිළධාරීන් නොමැති බව.	වර්ෂය තුළ බිල්ගත කරනු ලබන ආදායම වර්ෂය තුළදී එකතු කර ගැනීමට අවශ්‍ය සියළු කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු ආදායම රු. 76,334,098 ක් වූ අතර පෙර වර්ෂයේ රු. 53,269,000 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායමට වඩා රු. 23,065,098 ක එනම් සියයට 43 ක වර්ධනයක් අත් කරගෙන තිබුණු නමුත් මහා නගර සභා ආඥා පනතේ 247(අ) I වගන්තිය අනුව මේ පනතේ හෝ ආඥා පනත යටතේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථාව හෝ විස්තර කර ඇති කාර්යය සඳහා ස්ථානයක් පාවිච්චි කිරීමට බලපත්‍රයක් දිය යුතු වුවද, අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමකින් තොරව නීතියට පටහැනිව බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකළ අවස්ථා විය.	ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොමැති සියලුම වෙළඳ කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීමට කටයුතු කර නිතීවලට පටහැනි නොවන ආකාරයට වෙළඳ බලපත්‍ර අයකර ගැනීමට කටයුතු කරන බව.	මහා නගර සභා අඥාපනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු අතර වෙනත් පාලන අධිකාරියක් යටතේ පාලනය නොවන සියළුම ව්‍යාපාර වර්ග සඳහා අතුරු ව්‍යවස්ථා සම්මත කර නියාමනය කර බලපත්‍ර ලබාදීම කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොළඹ නගරයේ සාමාන්‍ය වැසි තත්ත්වයකදී පවා ජලයෙන් යටවන ස්ථාන 20 ක් පමණ මහා නගර සභාව විසින් හඳුනාගෙන තිබුණි. ඒ අතරින් ස්ථාන 13 ක් සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත් 03 ක් අවසන් වී තිබුණි. ස්ථාන 07 ක් සම්බන්ධව මේ වනතුරු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වන බව.	හඳුනාගත් ස්ථාන සම්බන්ධව පිළියම් යෙදීම කඩිනම් කළ යුතුය.
(ආ)	ලෝක බැංකුවේ ණය ආධාර මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ	මෙම ඉඩම පවරා ගැනීමට අමාත්‍යවරයාගේ අනුමැතිය	ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට

ක්‍රියාත්මක වූ කොළඹ නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් නොරිස් ඇල සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මේ මගින් නොරිස් ඇලට එකතු වන වැසි ජලය සීඝ්‍රයෙන් බේරේ වැවට බැස යාම සඳහා ආර්නෝල්ඩ් රත්නායක මාවත ඔස්සේ ටී.බී.ජයා මාවත හරහා මීටර් 632 කින් යුත් නව ඇල මාර්ගයක් ඉදිකිරීම ආරම්භ කළ නමුත් කොළඹ නගර සභාවට අයත් නිවාස 36 කින් යුත් අබලන් නිවාස සංකීර්ණයක් හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වී තිබුණි. ඉතිරිව තිබූ මීටර් 105 ක් වූ ඇළ මාර්ගය නිම කිරීම සඳහා පසුගිය වර්ෂයේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ රු.මිලියන 150 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණද පදිංචිකරුවන් ඉවත් කිරීමට ගෙන තිබූ ක්‍රියාමාර්ග කඩිනම් නොවීම හේතුවෙන් කොළඹ මහා නගර සභාවට එකී මුදල උපයෝජනය කිරීමට නොහැකි වීමෙන් මරදාන ඩීන්ස් පාර වැසි ජලයෙන් යට වීම වළක්වා ගත නොහැකි වී තිබුණි.	ලබා ගැනීමට යොමු කර ඇති බව.	ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොළඹ මහා නගර සභාවේ වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු හැරුණු විට කුලී, රථවාහන ගාල් කිරීමේ ගාස්තු, දැන්වීම් පුවරු ගාස්තු ආදී ආදායම් අයකර ගැනීම සඳහා ගෙවිය යුතු පුද්ගලයා වෙත ඉන්වොයිසියක් මගින් බිල් කිරීමක් සිදුකර නොතිබුණි. මේ නිසා ගෙවිය යුතු පුද්ගලයා ගෙවීම් පිළිබඳ දැනුවත් නොවීම ප්‍රායෝගිකව ආදායම බිල් නොකිරීම හා දත්ත පද්ධතිය යාවත්කාලීන නොවීම මෙන්ම සභාවට ලැබිය යුතු ආදායම් අත්හැරීමක් ද සිදුව තිබුණි.	MCAS පද්ධතිය වැඩිදියුණු කර ඉදිරි වර්ෂයේදී ආදායම බිල් කිරීමට කටයුතු කරන බව.	ආදායම් බිල් කිරීම නිවැරදිව ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා ගෙවිය යුතු පුද්ගලයා වෙත ගෙවිය යුතු දිනට පෙර ඉන්වොයිසියක් නිකුත් කළ යුතුය. තවද හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කොළඹ නගරය තුළ අවමංගල ශාලා සහ අවමංගල භාරකරුවන් සම්බන්ධව රීතියක් විගණනයට ඉදිරිපත් නොවීය. එසේම 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ IL III කොටස යටතේ සඳහන් අවමංගල ශාලා සහ අවමංගල්‍ය කටයුතු භාරකරුවෝ සම්බන්ධයෙන් ඇති සම්මත අතුරු	ඉදිරි මාස 02 ක කාලය සොයා බලා අතුරු ව්‍යවස්ථා වැළඳගැනීමට කටයුතු කරන බව.	නව රීතියක් සම්මත කරගැනීමට හෝ සම්මත රීතිය වැළඳ ගැනීමට කටයුතු කළ යුතුය.

	ව්‍යවස්ථාව වැළඳගත් බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොවීය. මේ හේතුවෙන් විෂයභාර නිළධාරීන්ට කැමති ආකාරයට එකී විෂයයන් භාවිතා කර තිබුණි.		
(ඇ)	කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ මෘත ශරීර කල්තබා ගැනීමේ/සකස් කිරීමේ ව්‍යාපාරයක් (එම්බාම් කිරීම) සඳහා 2024 වර්ෂය තුළ බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි. 2023 නොවැම්බර් 17 දිනැති අංක 2359 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති කොළඹ මහා නගර සභාවේ බලපත්‍ර සහ ගාස්තු අයකිරීමේ නිවේදනයේ 150 වන අයිතමය යටතේ මෘත ශරීර කල්තබා ගැනීමේ/ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ඇතුළත් කර ඇති නමුත් එය මහා නගර සභා ආඥා පනතේ 247 අ (2) වගන්තියේ සඳහන් කරුණුවලට පටහැනි බව නිරීක්ෂණය විය.	විධිමත්ව පරීක්ෂා කර බලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.	මහා නගර සභා ආඥා පනතට අනුකූලව කටයුතු කර අතුරු ව්‍යවස්ථාවන් සම්මත කර බලපත්‍ර නිකුත් කළ යුතුය.
(ඈ)	2023 නොවැම්බර් 17 දිනැති අංක 2359 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 149 අයිතමය යටතේ ප්‍රසිද්ධ කර තිබූ අවමංගල්‍ය ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ගාස්තු නියම කර තිබුණු නමුත් එකී නියම කිරීම මහා නගර සභා ආඥා පනතේ 247 අ (2) වගන්තියට පටහැනි විය. කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ අවමංගල්‍ය ශාලාවක් පවත්වාගෙන යාම සඳහා අතුරු ව්‍යවස්ථාවක් රහිතව 2024 වර්ෂය සඳහා ආයතන 04 ක් වෙත බලපත්‍ර නිකුත් කර තිබුණි.	නීත්‍යානුකූල ආකාරයට අතුරු ව්‍යවස්ථාවක් පිළියෙල කර සම්මත කර ගැනීමෙන් අනතුරුව බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමෙන් තොරව බලපත්‍ර නිකුත් නොකළ යුතුය.
(ඉ)	2022 දෙසැම්බර් 27 දිනැති අංක 3449 දරන මහා සභාවේ තීරණය සහ 2023 ඔක්තෝබර් 03 දිනැති අංක 310 හා 2024 මාර්තු 05 දිනැති අංක 593 දරන නාගරික කොමසාරිස් තීරණ මඟින් සුසාන භූමි ගාස්තු සංශෝධනය කර තිබුණ ද, එකී ගාස්තු 1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරවිය යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර මහා නගර සභාව විසින් සුසාන භූමි ගාස්තු අයකර තිබුණි.	කල්තබා ගැනීමේ ක්‍රමවේදයන්වල වෙනසක් හේතුවෙන් ආදායම් අඩුවී ඇති බවත් නිසි ක්‍රමවේදය යටතේ ගාස්තු අයකර ඇති බව.	සුසාන භූමි ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ පළකර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය.

(ඊ)	1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 23 වගන්තියට පටහැනිව 1980 වර්ෂයේ සිට භූමදාන කටයුතු සඳහා සුසාන භූමියේ බිම් කොටස් වෙන්කර තැබීම සම්පූර්ණයෙන්ම නතර කර තිබූ අතර සිහිවටන සඳහා 2′ x 2′ ප්‍රමාණයේ බිම් කොටස් වෙන්කර දීම සිදුකර තිබුණි. එහෙත් මේ සඳහා සුසාන භූමි ආඥා පනතේ නියම කර ඇති පරිදි විකුණනු ලබන කොටස් සම්බන්ධයෙන් සිතියම් හා ලේඛන පවත්වා ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. බොරැල්ල කනත්ත සුසාන භූමියේ මිනි වළවල් හා ස්මාරක සඳහා වෙන් කිරීම් සම්බන්ධව සිතියමක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර සුසාන භූමි කාර්යාලයේ ද එවැන්නක් නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් පැවති සිතියම් අස්ථානගත වී ඇති බවට හෙළිදරව් කර තිබුණද ඒ පිළිබඳව සභාව විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නවීන තාක්ෂණ යොදාගෙන සිතියම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත් වෙන්කිරීමේ ලේඛන මුද්‍රිත ආකෘති නොමැති වීම නිසා සීආර් පොතක ලේඛනගත කරන බව හා සුසාන භූමියේ පැවති සිතියම් දිරාපත් වී ඇති බවත් ඉදිරියේදී සිතියම්ගත කිරීමට කටයුතු කරන බව.	සියලුම ස්ථාන සිතියම්ගත කර තවදුරටත් අවභාවිතා වීම වළක්වාලිය යුතුය.
(උ)	බොරැල්ල කනත්ත සුසාන භූමියේ 2′ x 2′ ප්‍රමාණයේ ස්මාරකයක් ඉදිරිකිරිම සඳහා බිම් ප්‍රමාණයක් වෙන් කරවා ගැනීමේ ගාස්තුව රු . 500,000 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ස්මාරක 12 ක් සඳහා ගාස්තු අයකර තිබූ නමුත් විගණනයේදි එකී ස්මාරක කවරේද යන්න සුසාන භූමි පාලකට පෙන්වා දිය නොහැකි විය. ඒ අනුව බිම්කොටස් උපයෝජනයේදී සිදුවිය හැකි දූෂණයන් වලක්වා ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ස්මාරක 12 මේ වන විට පරිගණකගත කර ඇති අතර ඉදිරියේදී මෙම ස්ථාන සිතියම්ගත කිරීමට අපේක්ෂිත වන බව.	ලේඛන පවත්වා ගැනීම නිසි පරිදි කළ යුතුය.
(ඌ)	1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව සෑම ප්‍රදානයක්ම සටහන් කෙරෙන ලේඛනයක් සුසාන භූමි පාලකයා විසින් තබා ගත යුතු අතර එම ප්‍රදානය සිදුකළ දිනයන්, ඒ හා සම්බන්ධ වූ පක්ෂත්, ඉදින් එබඳු ප්‍රදානයක් සම්බන්ධයෙන් මුදල් අය කිරීමක් වී නම් එයත්, එම ප්‍රදානයෙහි විස්තරේ ඇති භූමිය හඳුනා ගන්නට පුළුවන් වන පරිද්දෙන් ඒ පිළිබඳව කරනු ලබන නිසි විස්තරයකුත් ඇතුළත් ස්මරණ සටහනක්, යථෝක්ත ප්‍රදානය සිදුකොට දින 14 ක් ඇතුළත	මුද්‍රිත ලේඛන නොමැති වීම මත සීආර් පොතක් මඟින් තොරතුරු ලේඛනගත කරන බව.	1946 අංක 57 දරන පොදු සුසාන භූමි පනත අනුව කටයුතු කළ යුතුය.

පූර්වෝක්ත සුසාන පාලක විසින් එම ලේඛනයේ සටහන් කළයුතු වේ. එහෙත් සුසාන භූමි 03 ක් සඳහා එම සම්පූර්ණ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. සියලුම සුසාන භූමිවල විකුණා ඇති බිම් කොටස් හඳුනාගෙන ඒවා පවත්වාගෙන යාමටත් නිත්‍යානුකූල නොවන සියලුම ඉදිකිරීම් 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 26 වන වගන්තිය ප්‍රකාරව ඉවත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

		විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)		කොළඹ නගරයේ රථ වාහන ගාල් කිරීමේ ස්ථාන 30 ක කොන්ත්‍රාත් කාලය ඉකුත්වීම හේතුවෙන් එකී ස්ථාන කෙටි කාලයකට බදු දීමට සීමිත මිල කැඳවීමක් සිදුකර තිබූ අතර මිල ගණන් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2023 ජුනි 15 දින විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
	i	වෙනත් ස්ථානවල රථ වාහන ගාල් පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුවන්ගෙන්ම මිල ගණන් කැඳවා තිබියදීත් ඇගයීම් නිමකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් 2023 ජුලි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයට මහා නගර සභාවට ලැබිය යුතු රු. 18,750,800 ක ආදායමක් අහිමි වී තිබුණි.	නව කොන්ත්‍රාත්තුව ආරම්භ වන තෙක් පැවති කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලද බැවින් මූල්‍යමය පාඩුවක් නොවුන බව.	මහා නගර සභාවට ලැබිය යුතු ආදායම් අහිමි කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
	ii	2022 අගෝස්තු 31 දිනැති අංක 3242 දරන සභා තීරණය අනුව ගෙවීම් පැහැර හැර නැති කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවිය හැකි බවත්, මිල ගණන් කැඳවීමේ ලේඛනයේ 13 වන ඡේදය අනුව මහා නගර සභාවට ගෙවීම් හිඟව පවතින ආයතන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නුසුදුස්සන් වන බවත්, සටහන් කර තිබියදී 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 141,344,056 ක හිඟ මුදලක් සහිත කොන්ත්‍රාත්කරුවන් හත් දෙනෙකු තෝරාගෙන කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.	නාගරික කොමසාරිස්ගේ තීරණය පරිදි හිඟ මුදල කොටස් වශයෙන් ගෙවීමේ පදනම මත කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද බව.	මිල ගණන් කැඳවීම් ලේඛනයේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

iii	සභා තීරණය හා මිල කැඳවීමේ ලේඛනයේ 12 වන ඡේදය අනුව දැනටමත් වාහන ගාල් කිරීමේ කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්ගතව ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් මිල කැඳවීම් සිදුකළ යුතු වුවත් එයට පටහැනිව නවක ආයතන 07 කින් මිල ගණන් ලබාගෙන එයින් ආයතන 03 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.	කොන්ත්‍රාත්කරුවන් වැඩිවන පමණට සභාවට සිදුවන වාසිය වැඩිවන බැවින් අවස්ථාව සලසා දී ඇති බව.	සභාවට වඩාත් වාසිදායක වීමට විවෘත මිල ගණන් කැඳවීම කළ යුතුය.
(ආ)	කොළඹ නගරයේ සුහුරු (LED) ලාම්පු ව්‍යාපෘතිය මහා නගර සභාවට වියදම් රහිත ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ ද, මහා නගර සභාව විසින් නඩත්තු වියදම් ලෙස රු.මිලියන 1,478 ක් ද ගෙවීමට එකඟතාවයක් ලබාදීම මූලික අරමුණට පටහැනි විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
i	ශ්‍රී ලංකාවේ ප්‍රධානම ආර්ථික කලාපය මෙන්ම රටේ ප්‍රධාන ආර්ථික පද්ධතිය ක්‍රියාත්මක වන මහා නගර සීමාව තුළ ජනාධිපති මන්දිරය, අරලියගහ මන්දිරය, මහා බැංකුව, මහා භාණ්ඩාගාරය ඇතුළු ප්‍රධාන ආයතන ඇතුළු රාජ්‍යතාන්ත්‍රික ආයතනවල ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් තහවුරුවක් ලබා නොගෙන කොළඹ නගරයේ සුහුරු ලාම්පු සමඟ අධිතාක්ෂණික මෙවලම් සවිකිරීමට ගිවිසුම්ගත වී තිබීම මතභේදාත්මක විය.	මේ වන තෙක් නිසි පරිදි පූර්ව අනුමැතිය ලබාගෙන කටයුතු කර ඇති බව.	ගිවිසුම නැවත සමාලෝචනය කර අවශ්‍ය ඉදිරි පියවරයන් ගත යුතුය.
ii	ලංසු ඇගයීමේදී පෞද්ගලික සමාගම පෙන්වා දී තිබූ අනුබද්ධිත ආයතන 03 ක එකතුව වූ රු.මිලියන 700 කට සමාන පිරිවැටුමක් පිළිගෙන තිබුණ ද මව් සමාගම හෝ අනුබද්ධ සමාගම් කවරේද යන්න හඳුනාගෙන නොතිබුණි. ආයතනය ඉදිරිපත් කළ ලංසු බැඳුම්කරයේ කාලය ප්‍රමාණවත් නොවීම මත ප්‍රතික්ෂේප කර රු.මිලියන 6,444 කින් වැඩි ආයෝජන යෝජනාව අත්හැර තිබීමෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව අපක්ෂපාතිව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	ලංසුකරුට අනුබද්ධ සමාගම් හතර ඒකාබද්ධ වූ විට රු.මිලියන 700 ක පිරිවැටුමක් පෙන්විය හැකි බව.	නැවත මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය.

iii	තෝරාගෙන තිබූ පුද්ගලික සමාගම ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහය අනුව මුල් වසර 04 ඇතුළත රු.මිලියන 700 ක ආයෝජනය පවත්නා ප්‍රකාශිත ප්‍රාග්ධනය මෙන් 70 ගුණයක් වීම හේතුවෙන් හා ඇගයීමට ඉදිරිපත් කරන ලද ඊට අදාළ සමාගමක් සිය වත්කම් පෞද්ගලික බැංකුවකට උකස් කර රු.මිලියන 15 ක ණය මුදලක් ලබාගෙන තිබීම හේතුවෙන් එම සමාගම සමූහය ලෙස රු.මිලියන 2500 ක ආයෝජනයක් කිරීමට මූල්‍ය හැකියාවක් නොතිබියදී කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.	කොටස් හිමියන්ගේ ආයෝජන ලෙස රු.මිලියන 700 ක් අවුරුදු 04 ක් තුළ ලබා ගැනීමට ප්‍රමාණවත් වත්කම් පැවති බව මූල්‍ය ප්‍රකාශන අනුව තහවුරු වන බව.	මහා නගර සභාවට අවාසිදායක තත්වයන් ඇති නොවීමට සියළු ක්‍රියාමාර්ග ගත යුතුය.
iv	මෙම ව්‍යාපෘතිය යටතේ දැනට පවත්නා විදුලි පහන් කණුවල ලාම්පු වෙනුවට අධි තාක්ෂණික එල්.ඊ.ඩී බල්බ සවිකිරීම ප්‍රධානම අංගය විය. කොන්ත්‍රාත් සමාගම විසින් ලාම්පු මාරු කිරීම ඇතුළුව වාර්ෂිකව රු.මිලියන 500 ක ආයෝජනයක් සිදු කිරීමට අපේක්ෂිත බැවින් මෙම ආයෝජනය කොළඹ මහා නගර සභාවටම ඉටු කරගෙන ලැබිය හැකි සම්පූර්ණ ප්‍රතිලාභයක් මහා නගර සභාවට ලබා ගැනීමට කටයුතු කිරීම මඟහැර තිබුණි.	වාර්ෂිකව රුපියල් මිලියන 500 ක් වීදි ලාම්පු සඳහා ආයෝජනය කිරීමට මහා නගර සභාවට මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා රාජ්‍ය හා පෞද්ගලික ව්‍යාපාරයක් ආරම්භ කිරීම අනුමත කර ඇති බව.	මහා නගර සභාවට අවාසිදායක තත්වයන් ඇති නොවීමට සියළු ක්‍රියාමාර්ග ගතයුතුය.
v	සංශෝධිත ගිවිසුමේ 1(a) හා (b) මඟින් සභාවේ ප්‍රචාරක හිමිකම කොන්ත්‍රාත්කරු වෙත පැවරීමේ දී දැනටමත් මහා නගර සභාව විසින් අවස්ථාව සලසා දී ඇති පුද්ගලික ස්ථාන සම්බන්ධයෙන් සිදු වී ඇති අයුතු කඩකිරීම් සහිත ක්‍රියාකාරකම් නිවැරදි කරන තෙක් සභාවෙන් අධිහාර කිරීමට කොන්ත්‍රාත්කරුට බලය පවරා තිබීම මහා නගර සභාවට අවාසිදායක කොන්දේසියක් විය.	තුන්වන පාර්ශවයක් මඟින් කරනු ලබන LED සහ Digital දැන්වීම් සඳහා පමණක් ප්‍රචාරණ සීමා පැනවෙන අතර අනෙකුත් දැන්වීම් ප්‍රචාරණය සඳහා සීමා කිරීමක් සිදු නොවන බව.	මහා නගර සභාවට වාසිදායක තත්ත්වයක් ඇති කිරීමට වගබලා ගත යුතුය.
(ඇ)	පොත් බෙදාදීමේ කාර්යය සඳහා පුද්ගලික ආයතනයකින් ආහාර මිලදී ගත් බවට කූට ලෙස සකස් කළ ඉන්වොයිස් 17 ක් ඉදිරිපත් කර රු. 2,342,110 ක් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.	රහස්‍ය වාර්තාවක් මඟින් ඉන්වොයිස් 17 නිවැරදි බවත් සැපයුම්කාර ආයතනයට ලැබී ඇති බවත් තහවුරු කර ඇති බව.	මේ පිළිබඳ මූලික විමර්ශනයක් පැවැත්විය යුතුය.

(ඈ)	අඩු ආදායම්ලාභීන් සඳහා සහන සැලසීම වෙනුවෙන්ම මහා නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් තනතුර ඇති කොට 215 ක අනුමත කාර්ය මණ්ඩලයක් සහිතව පවත්වාගෙන යන මහජන ආධාර දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රාජකාරි යටතට 2023 වර්ෂයේ පාසල් පොත් බෙදාදීමේ වැඩසටහන වැනි සහන වැඩසටහන් ද අයත් විය. එම වැඩසටහනට සහභාගී වූ නිලධාරීන්ට හා සේවකයින්ට සංග්‍රහ කිරීම සඳහා රු. 2,956,624 ක් වැයකර තිබුණු නමුත් සහභාගී වූ නිලධාරීන් හා සේවකයින් පිළිබඳ පැමිණීමේ ලේඛන හෝ සහභාගීත්වය තහවුරු කිරීම සඳහා ලේඛන පවත්වාගෙන ගොස් නොතිබූ අතර එවැනි වියදමක් දැරීම මහා නගර සභා ආඥා පනතේ 188 (1) වගන්තිය යටතේ ඉඩදිය නොහැකි වියදමක් ද විය.	නාගරික කොමසාරිස්ගේ හා පුණ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය අනුව පනතේ 188 වගන්තිය අනුව වියදම් දරා ඇති බව.	මහා නගර සභා අරමුදල් වැය කිරීමේදී පනතට අනුකූලව කටයුතු කළ යුතු අතර සාක්ෂි මඟින් තහවුරු ද කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව නාගරික ලේකම් දෙපාර්තමේන්තු ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව මුද්‍රණ යන්ත්‍ර සංඛ්‍යාව 51 ක් බව දැක්වෙතත් භෞතික පරීක්ෂාවේදී වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් ද සමඟ මුද්‍රණ යන්ත්‍ර 63 ක් පැවතුණි.	මේ වන විට ඉන්වෙන්ට්‍රි ලේඛන ගත කර ඇති බව.	මහා නගර සභාවේ සියළු අංශවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදුකළ යුතුය.
(ආ)	නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ මුද්‍රණ යන්ත්‍ර 15 ක් හා ඡායා පිටපත් යන්ත්‍ර 05 ක් සුළු හෝ විශාල දෝෂ හේතුවෙන් භාවිතා කිරීමකින් තොරව පැවති අතර එම යන්ත්‍ර සේවාකර ගැනීමේ ක්‍රමවේදයක් නොවූ බැවින් භාවිතයෙන් ඉවත් කිරීමේ තත්ත්වයක් ඇති වී තිබුණි.	මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව තත්ත්ව පරීක්ෂාවක් කර ගිවිසුමක් හරහා සේවා කිරීමට පියවර ගෙන ඇති බව.	නඩත්තු හා අලුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුය.
(ඇ)	නියෝජ්‍ය නාගරික කොමසාරිස් කාර්යාලය හා සංග්‍රහ විෂය භාර නිලධාරී වෙත රු. 552,740 ක් වටිනාකම වූ වර්ණ ටෝනර් 14 ක් නිකුත් කර තිබූ අතර එකී වර්ණ ටෝනර් කුමන රාජකාරියක් සඳහා භාවිතා කළේ ද යන්න තහවුරු නොවීය.	නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ විවිධ වර්ණ මුද්‍රිත අවශ්‍යතා සඳහා භාවිතා කර ඇති බව.	වියදම් පාලනය කළ යුතු අතර ටෝනර් භාවිතය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බහුකාර්යය සංවර්ධන සහයකයන් ලෙස පුහුණුව සඳහා බඳවා ගත් අය අතරින් 2023 ජුනි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත්වීම් ලබාදී කොළඹ මහා නගර සභාවට අනුයුක්ත කළ කම්කරුවන් 37 දෙනෙකු කොළඹ මහා නගර සභාවේ සේවයේ නියුක්ත කිරීමකින් තොරව බස්නාහිර පළාත් සභාවට අයත් වෙනත් කාර්යාලවලට අනුයුක්ත කර කොළඹ මහා නගර සභාවෙන් වැටුප් ලෙස එකතුව රු. 17,898,823 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි.	බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාර වරයාගේ උපදෙස් ප්‍රකාරව කටයුතු කර ඇති බව.	මහා නගර සභා සේවකයින් වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීම් හා මහා නගර සභාවෙන් ඔවුන් වෙත වැටුප් ගෙවීම නිවැරදි කළ යුතුය.
(ආ)	බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සුසාන භූමි භාරකරු (විශේෂ ශ්‍රේණිය) තනතුරක් දරමින් කොළඹ මහා නගර සභාවේ බොරැල්ල සුසාන භූමියට අනුයුක්තව සේවය කළ තැනැත්තා ව්‍යාජ ලදුපතක් ලබාදීම හේතුවෙන් ඔහුගේ රාජකාරී වැඩ 2021 අප්‍රේල් 30 දින සිට නාගරික කොමසාරිස් විසින් තහනම් කර තිබූ අතර 2023 ජනවාරි 13 දිනැති ලිපිය මගින් නැවත රාජකාරි භාර ගැනීමට ලිඛිතව දන්වා තිබුණි. ඒ අනුව ඔහු 2023 ජනවාරි 23 දින සේවයට වාර්තා කර තිබුණු අතර එදින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වැඩකරන දින 477 ක් අතරින් දින 90 ක් පමණක් සේවයට වාර්තා කර තිබුණු නමුත් සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2025 මාර්තු 04 දිනැතිව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කරන ලද බව.	විධිමත් විනය පරීක්ෂණය කඩිනම් කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය සහ 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/6 දරන ගැසට් පත්‍රයේ 8 වන නියෝගය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට වූ සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුගාමී මුදල්	පිළිතුරු ලබාදී නොමැත.	නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සභාවේ මූල්‍ය ප්‍රකාශන දින 94 ක් ප්‍රමාද වී 2025 ජුනි 03 දින ඉදිරිපත් කරන ලදී.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන අනුව සත්‍ය ආදායම රු. 15,538,425,829 ක් වූ අතර අයවැයගත ආදායම රු. 28,744,858,000 ක් වීමෙන් සියයට 46 ක ආදායම් විචලනයක් පැවැතිණි. කොළඹ මහා නගර සභාව සඳහා ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී තාර්කික පදනමින් තොරව ආදායම් ඇස්තමේන්තු කිරීම හේතුවෙන් හෝ ඇස්තමේන්තුව සාධාරණ වන්නේ නම් ආදායම් එකතු කිරීමට බලය පවරා ඇති නිලධාරීන්ගේ නොසැලකිළිමත් බව හේතුවෙන් ආදායම් රැස්කර ගැනීමට නොහැකි වීම නිසා ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම අතර සියයට 10 ට වඩා වැඩි වෙනස්කම් පැවතුණි.	ආදායම් විචලනයට හේතු වී ඇත්තේ අපේක්ෂිත රජයේ ආධාර හා වෙනත් ආධාර නොලැබීමය.	වඩාත් තාත්වික ආදායම් ඇස්තමේන්තු සකස්කළ යුතුය.

4.3 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 22 ක් නිකුත් කර තිබූ අතර ඉන් වාර්තා 07 ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි. අභ්‍යන්තර විගණක ලබා දුන් නිර්දේශ ඇතුළත් විගණන විමසුම් 22 සඳහාම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	විගණන විමසුම් සඳහා නියමිත කාලය තුළ පිළිතුරු ලබාදීමට කටයුතු කිරීම හා අභ්‍යන්තර විගණන විමසුම්වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කරගත යුතුය.